මාධ්‍ය නිවේදන - අංක 28

මැතිවරණ කොමිෂන් සභාව

**පාර්ලිමේන්තු මැතිවරණය - 2020.08.05**

**තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සහ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම**

2020 පාර්ලිමේන්තු මැතිවරණයේ තැපැල් ඡන්ද නිකුත් කිරීම, සලකුණු කිරීම හා නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම සම්බන්ධව අදාළ කටයුතු මේ වනවිට සංවිධානය කර තිබේ.

02. තැපැල් ඡන්දදායකයින්ගේ ලැයිස්තු සහතික කිරීම **2020 ජුනි** මස **18** වන දින සිදු කෙරෙන අතර, තැපැල් ඡන්ද පත්‍රිකා නිකුත් කිරීම හා තැපෑලට භාරදීම **2020 ජුනි** මස **30, ජූලි** මස **01** සහ **02** දිනවල දී සිදු කරනු ලබයි.

03. ඒ අනුව රාජ්‍ය ආයතනවල (දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, පොලීසිය, ආරක්ෂක හමුදා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අංශ හැර) තැපැල් ඡන්ද හිමියන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම **2020.07.14** සහ **2020.07.15** යන දිනයන්හි දී සිදු කිරීමට නියමිත අතර, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, මැතිවරණ කාර්යාල, පොලීසිය, ආරක්ෂක හමුදා, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ සෞඛ්‍ය අංශවල තැපැල් ඡන්ද හිමියන්ගේ තැපැල් ඡන්ද සලකුණු කිරීම **2020.07.16** සහ **17** දින දහවල් **12.00** දක්වා සිදු කෙරේ. මෙම දිනවල තැපැල් ඡන්ද සලකුණු කිරීමට නොහැකි වන තැපැල් ඡන්ද හිමියන්ට **2020.07.20** සහ **21** දිනවල තමන්ගේ සේවා ස්ථානය පිහිටි දිස්ත්‍රික්කයේ, දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවල දී තැපැල් ඡන්දය සලකුණු කිරීමට අවස්ථාව සලසා ඇත.

04. 2020 පාර්ලිමේන්තු මැතිවරණයේ නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා තැපෑලට භාරදීම **ජූලි** මස **11, 12** සහ **13** දිනවල දී සිදු කිරීමට කටයුතු යොදා තිබේ.

05. නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදාහැරීම **2020.07.29** වන දින අවසන් වේ. **2020.07.29** දිනයෙන් පසුව නිල ඡන්ද දැන්වීමක් නොලැබූ ඡන්ද හිමියන්ට 2019 ඡන්ද හිමි නාම ලේඛනයේ ලියාපදිංචි ලිපිනයට අදාළ තැපැල් කාර්යාලය වෙත ගොස් ස්වකීය අනන්‍යතාව ප්‍රකාශ කිරීමෙන් අනතුරුව නිල ඡන්ද දැන්වීම්පත ලබාගත හැකි බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය
සභාපති, මැතිවරණ කොමිෂන් සභාව
මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.
2020.06.16